මන්නාරම නගර සභාව

මන්නාරම දිස්ත්‍රික්කය

-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 වන දිනද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 12 වන දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 ආගෝස්තු 15 වන දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට මන්නාරම නගර සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත කරුණු අනාවරණය විය.

(අ) සභාවේ මූල්‍ය ප්‍රකාශනවල ඇති ශේෂ පත්‍රයෙහි දක්වන ලද වත්කම්වල අගය එහි ගිණුම්කරණ සටහන්වල අගයට වඩා රු.129,141 කින් වැඩියෙන් පෙන්නුම් කෙරුණි.

(ආ) ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ භාවිතයට ගත නොහැකි වර්ෂ තුනකට වඩා වැඩි කාලයක් අළුත්වැඩියා නොකරන ලද රු.14,289,000 ක් වටිනා වාහන මූල්‍ය ප්‍රකාශන තුළ පෙන්නුම් කිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම් රු.14,289,000 කින් වැඩිපුර පෙන්නුම් කර තිබුණි.

(ඇ) ප්‍රවර්ධන වර්ෂය සඳහා වූ විගණන ගාස්තු සඳහා වෙන් කිරීමක් සිදු කර නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන ලද ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම වූ රු.264,900,000 ක් සහා සේවක ණය හා අත්තිකාම් රු.10,540,852 ක වටිනාකම භෞතිකව තහවුරු කිරීමට අවශ්‍ය සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

1.3.3 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

----------------------------------------------------------------------------------------------------

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ සඳහා අනුකූල නොවීම පහත පරිදි විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි සඳහා යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි | |
| | i. මුදල් රෙගුලාසි 371 හා පළාත් මුදල් රීති 219 | අවස්ථා 24කට අදාළව විවිධ පොදු කටයුතු වෙනුවෙන් නගර සභාවේ නිලධාරීන් සඳහා හා බාහිර පාර්ශවයන් වෙනුවෙන් 1984 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලය තුළ ලබාදුන් නියාදනය නොකළ අතුරු අග්‍රිම වටිනාකම වූ රු.1,723,204 ක් සඳහා මෙම වාර්තාවේ දිනය තෙක් නියාදනය කිරීමට පියවර ගෙන නොතිබුණි. |
| | ii. මුදල් රෙගුලාසි අංක 571 | රු.1,034,168 ක වටිනාකම ඇති පොදු තැන්පතු දිගු කාලයක සිට නියාදනය නොකළ පොදු තැන්පතු ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ පෙන්නුම් කළ ද ඒ සඳහා අවශ්‍ය පියවරයන් ගෙන නොමැති බවට නිරීක්ෂණය විය. |
| | iii. මුදල් රෙගුලාසි 104 | 2016 වර්ෂයේදී නිකුත් කළ විගණන විමසුමක් වෙනුවෙන් සභාවේ රියදුරකුගෙන් රු.5,985 ක් අයකර ගෙන තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව ගෙන ඇති පියවරයන් කවරෙද යන්න 2017 ජූනි 25 දින දක්වා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | නගර සභා ආඥා පනත (255) 160 වන රෙගුලාසිය | නගර සභා බල සීමාවට අයත් ඉඩම්, ගොඩනැගිලිවලින් හා ඉදිකිරීම්වලින් වර්ෂ 2016 අග දක්වා අයවිය යුතු එකතුව රු.4,144,365 ක් වටිනා වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.27,014,174 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.22,760,511 ක් විය.

### 2.2 ආදායම් කළමනාකරණය

----------------------------

#### 2.2.1 අයවැය ගත ආදායම, තත්‍ය ආදායම හා ලැබිය යුතු ආදායම

------------------------------------------------------------------

සභාව විසින් ප්‍රවර්ථන වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද අයවැයගත ආදායම, තත්‍ය ආදායම පිළිබඳ සැලකිය යුතු වෙනස්වීම් පහත පරිදි නිරීක්ෂණය විය.

| ආදායම් විස්තරය | අයවැයගත ආදායම | තත්‍ය ආදායම | හිඟ ආදායම | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| වරිපනම් බදු | 1,260,000 | 1,301,281 | 41,281 | 3 |
| බදු කුලිය | 19,521,400 | 24,981,997 | 5,460,597 | 28 |
| බලපත්‍ර ගාස්තු | 3,055,000 | 3,593,588 | 538,588 | 18 |
| සේවා ගාස්තු | 1,750,000 | 1,733,134 | (16,866) | (1) |
| වරෙන්තු ගාස්තු හා දඩ මුදල් | 310,000 | 573,630 | 263,630 | 85 |
| අනෙකුත් ආදායම් | 1,955,000 | 3,595,150 | 1,640,150 | 84 |
| රජය ප්‍රදාන | 60,515,150 | 50,723,150 | (9,792,000) | (16) |
| එකතුව | 88,366,550 | 86,501,930 | 1,864,620 | |

#### 2.2.2 මුද්දර ගාස්තු

---------------

රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙතින් 2007 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ ලැබිය යුතු රු.32,490,400 ක් වටිනා මුද්දර ගාස්තු අයකර ගැනීමට අවශ්‍ය වගකිව යුතු පියවරයන් සභාව විසින් ගෙන නොතිබුණි.

2.2.3 බදු කුලී

---------

(අ) 2016 වර්ෂයට අදාළ අයවිය යුතු වූ රු.6,631,556 ක් වටිනා බදු කුලී අය කර ගැනීමට අවශ්‍ය වගකිව යුතු පියවරයන් 2017 ජූනි 25 දින දක්වා සභාව විසින් ගෙන නොතිබුණි.

(ආ) නත්තල් උත්සව කාලයට අදාළව තාවකාලිකව ඉදි කළ කඩ භෞතික පරීක්ෂාවේදී කඩ 17 කට අදාළව රු.253,149 ක අලාභයක් එම කඩ අයිතිකරුවන් විසින් නගර සභාව වෙත සිදු කර තිබූ අතර 2017 ජූනි 25 දක්වා පුද්ගලයින් 04 දෙනෙකුගෙන් පමණක් රු.18,750 ක් අයකරගෙන තිබුණි.

2.2.4 අනෙකුත් ආදායම

--------------------

(අ) සභා බල ප්‍රාදේශය තුළ පිහිටුවා ඇති දුරකථන සමාගම් 03 කට අදාළව දුරකථන සම්ප්‍රේෂණ කුළුණු වෙනුවෙන් අයකර ගත යුතු බදු මුදල් අද දක්වා අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයට අයත් දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ඉදිකළ දින සිට විගණන දිනය වන 2017 ජූලි 25 දින දක්වා මාසික ගාස්තුවක් එම සමාගම වෙතින් අයකර ගැනීමට සභාව විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. මේ හේතුවෙන් සභාවට ලැබිය යුතු ආදායම් නොලැබීයාමක් සිදුවන අතර ආදායම් බදු පරීක්ෂකගේ හා ලේකම්වරයාගේ නොසැලකිලිමත් බව ඊට හේතු වී තිබුණි.

(ඇ) සභා ගිණුම්වල පෙන්වා ඇති රොලර් යන්ත්‍රයක්, ටිපර් රථයක් සහා JCB යන්ත්‍රයක් වෙතින් 2016 වර්ෂය දක්වා ලැබිය යුතු රු.19,500 ක ආදායම් අයකර ගැනීමට සභාව මඟින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

(අ) ප්‍රවර්ථන වර්ෂයේ අයවැය ඇස්තමේන්තු මඟින් වියදම් වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදනවල එකතුව වූ රු.1,903,780 ක් සම්බන්ධයෙන් සියයට 40 සිට සියයට 100 දක්වා වියදම් නොකර ඉතිරි කර තිබුණි.

(ආ) සභාවේ ලේකම්වරයකු, අභ්‍යන්තර විගණකවරයකු, විෂයභාර නිලධාරියකු හා ආදායම් පරීක්ෂකවරයකු සිටියදී ආදායම් රැස්කිරීමේ හිඟතාවය පෙන්නුම් කළ අතර එය ආයතන කටයුතු අකාර්යක්මතාවයට හේතුවී තිබුණි.

(ඇ) සභාවේ සිටින ආදායම් පරීක්ෂාවරුන්ට හා කාර්යාල කාර්යය සහයකයින්ට නිල ඇඳුම් දීමනා ලබාදී තිබුණද, රාජකාරී වේලාව තුළ එම නිල ඇඳුම් පැළඳීම මන්දගාමී ස්වරූපයක් දක්නට ලැබුණි.

(ඈ) මන්නාරම නගර සභාවෙහි භාවිතයට ගත නොහැකි හා අළුත්වැඩියා කර නැවත භාවිතයට ගත නොහැකි වාහන 25 ක් දක්නට ලැබුණද ඒ සම්බන්ධයෙන් පසුගිය වර්ෂ 3 තුළ කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඉ) මන්නාරම නගර සභාව වෙත වැසි ජලය බැස යාමට අවශ්‍ය කාණු පද්ධතින් යුනොප්ස් සංවිධානය(UNOPS) මඟින් 2016 ජනවාරි මස භාරදී තිබුණද, එම කාණු හා ඇළ මාර්ග උචිත පරිදි භාවිතා කර නොතිබුණි.

(ඊ) මන්නාරම නගර සභාව හා මන්නාරම ප්‍රාදේශීය සභාව අතර පියවිය යුතු හා ලැබිය යුතු ශේෂයන් දක්නට ලැබුණද එම ගණුදෙනු නිරවුල් කර ගැනීමට කිසිඳු පියවරක් පසුගිය වර්ෂ 10 තුළ ගෙන නෙතිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

2016 දෙසැම්බර් 31 දිනට පැවති අනුමත කාර්යය මණ්ඩල තුළ සේවක පුරප්පාඩු 08 ක් පැවති අතර එය පිරවීමට කටයුතු නොකිරීමෙන් එම නිලධාරීන් විසින් ඉටුකළ යුතු වැඩකටයුතුවලට බාධා ඇතිව තිබුණි.

3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-------------------------------------

(අ) සභා බල ප්‍රදේශය තුළ රැස් කරනු ලබන කැලි කසළ බෙදා වෙන් කිරීමට යටත්ව එකතු කිරීමේ වැඩපිළිවෙලක් යටතේ ක්‍රියාත්මක නොවීමෙන් කොම්පොස්ට් පොහොර සැකසීමේ කටයුතු හා නැවත භාවිත කිරීමේ කටයුතු සැලකිය යුතු මට්ටමක ඇති බව පෙන්නුම් නොකෙරුණි.

(ආ) සභා බල ප්‍රදේශයතුළ රැස් කරනු ලබන කැළි කසළ බෙදා වෙන් නොකර එකතු කිරීම හේතුවෙන් සැලකිය යුතු කැළි කසළ ප්‍රමාණයක් කොම්පොස්ට් පොහොර නිෂ්පාදනයට යොදා නොගෙන ගිනි තබා විනාශ කරනු ලබයි. මේ හේතුවෙන් මන්නාරම නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අංගනය අවට ජීවත්වන ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වයට මෙන්ම එහි අවට පසටද අහිතකර බලපෑම් එල්ල වී තිබුණි.

(ඇ) මන්නාරම නගර සභාව සතුව ස්ථිර හා තාවකාලික ලෙස අනුයුක්ත කළ සෞඛ්‍ය කම්කරුවන් අනුමත ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් සිටියද සභා බල ප්‍රදේශය තුළ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ කටයුතු නියමිත පරිදි සිදුකර නොතිබුණි.

4. යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

-------------------------------------------

4.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

---------------------------

(අ) මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කරන ලද ගිණුම්කරණ පදනම හෙළිරව් කර නොතිබුණි.

4.2 මෙහෙයුම් වාර්තාව

---------------------

මධ්‍යම රජයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2010 මාර්තු 10 වැනි දිනැති අංක PFLR/2/2/3/5(4) දරන ලිපිය ප්‍රකාරව එහි 1.4.1 උප වගන්තිය අනුව වාර්ෂික මෙහෙයුම් වර්තාවක් සකස් කළ යුතු වුවද, 2016 අගෝස්තු 10 දින දක්වා සභාව විසින් මෙහෙයුම් වාර්තාවක් සකස් කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය

------------------------

(අ) පළාත් අභ්‍යන්තර විගණන ඒකකය මඟින් අවස්ථා දෙකකදී පමණක් මූල්‍ය විගණනයන් සිදු කර තිබූ අතර අදාළ වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.

(ආ) කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජුනි 09 වැනි දිනැති අංක DMA/2009(I) දරන චක්‍රලේඛය ප්‍රකාරව එක් වර්ෂයක් සඳහා විගණන හා කළමනාකරණ කමිටු හතරක් පැවැත්විය යුතු බවට දක්වා තිබුණද, එපරිදි සිදු කර නොතිබුණි.

(ඇ) එක් එක් පළාත් පාලන ආයතන විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කළ යුතු බවට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 දිනැති අංක 03 දරන චක්‍රලේඛයෙහි 08 වැනි උපවගන්තිය ප්‍රකාරව දක්වා තිබීම මත සභාව විසින් ඒ අනුව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණද, එය නියමිත පරිදි පවත්වාගෙන ගොස් නොතිබුණි.

4.4 වත්කම් කළමනාකරණය

----------------------------------

මන්නාරම නගර සභාවෙහි වර්ෂ 03 කට වැඩි කාලයක් භාවිතා නොකළ එහෙත් අළුත්වැඩියා කර භාවිතයට ගත හැකි වාහන 10 ක් පැවතියද, ඒවා අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන

--------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ආදායම් රැස්කිරීම්

(ආ) අයවැය පාලනය

(ඇ) ලැබිය යුතු අත්තිකාරම්

(ඇ) සන අපද්‍රව්‍ය කළමනාකරණය

(ඉ) ආයතන කළමනාකරණය